**ඇලහැර ප්‍රාදේශීය සභාව**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**---------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**
**-----------------**

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 11 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 29 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 අගෝස්තු 11 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 **මතය**
**------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට **ඇලහැර** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආදායම් හා වියදම් ගිණුම් තැබීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය කර නොතිබුණි.

1.3.2. ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

මඩුදමන ජල ව්‍යාපෘතිය සඳහා ණය පදනම මත ලබාගෙන තිබුණු රු.56,351 ක් වූ උපකරණවල අගය මූල්‍ය ප්‍රකාශවලින් අත්හැරී තිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.5,307,819 ක් වූ විවිධ ණයහිමියන්, කර්මාන්ත ණයහිමියන්, පොදු සැපයුම් ණයහිමියන්, අත්තිකාරම් යන විෂයන්ට අදාල ශේෂයන් වර්ෂ 1 – 5 ත් අතර කාලයක සිට නිරවුල් නොකර ඉදිරියට ගෙනයමින් පවතින ශේෂයන් බව නිරීක්ෂණය විය.

1.3.4 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

-----------------------------------------------

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනකුල නොවීම |
|---|---|---|
| | ----------------------------------- | -------------------- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| | -------------------------------------- | |
| (i) | 132(ඔ) වගන්තිය | අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව, ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමධ්‍යගත අරමුදල් ලෙස එක් මන්ත්‍රීවරයකුට රු.100,000 බැගින් මුදල් වෙන්කර, සභා බල ප්‍රදේශයේ විවිධ පෞද්ගලික පාර්ශවයන් වෙත ද්‍රව්‍යයන් බෙදාදීම සඳහා සභා අරමුදලින් රු.1,345,926 ක් වැයකර තිබුණි. |
| (ii) | 150(1) , 152(1)හා 153(1) වගන්ති | කර්මාන්ත, වෙළඳ ව්‍යාපාර, වෘත්තීන් සහ සංවර්ධනය නොකරන ලද ඉඩම් පිළිබද වූ ලැයිස්තු පිළියෙල කර, වර්ෂයේ මාර්තු 31 දින හෝ ඊට ප්‍රථම සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| | රීති 99 | වියදම සහතික නොකරන ලද එකතුව රු. 3,983,807 ක් වූ වවුචර්පත් 22 ක් සඳහා ගෙවීම් සිදුකර තිබුණි. |
| (ඇ) | චක්‍රලේඛ හා ලිපි | |
| | -------------------- | |
| | පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මැයි 08 දිනැති අංක එන්සීපි/එල්ජී/ඒසී/4/1/2 දරන ලිපිය | 2015 වර්ෂයේ මැයි මාසයේ සිට සභාපතිවරයා විසින් භාවිතා කළ වාහනය සඳහා මසකට ලබාගත හැකි උපරිම ඉන්ධන සීමාව ලීටර් 10 කට සීමා කළයුතු බවට උපදෙස් ලබාදී තිබුණද, සභාවේ ලේකම්වරයා විසින් අනුමත සීමාව ඉක්මවා එම වාහනයට ඉන්ධන ලීටර් 2530 ක් භාවිතා කර තිබුණි. |

02. මූල්‍ය සමාලෝචනය

-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 1,178,968 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 437,239 ක් විය.

2.2 අදායම් පරිපාලනය

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිට තිබුණු රු. 721,839 ක් වූ වරිපනම් බදු වලින් රු. 253,848 ක් වර්ෂ 1 -5 ත් අතරද, රු. 365,232 ක් වර්ෂ 5 ට වැඩි කාලයක සිට හිඟහිටව තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි රු. 224,867 ක් වූ කඩ කුලී වලින් රු. 109,350 ක් වර්ෂ 1 -3 ත් අතර කාලයක සිට හිඟ හිටව තිබෙන අතර, මෙම සියළු මුදල් අයකර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි.

03 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

2014 අගෝස්තු 08 සිට 2015 දෙසැම්බර් දක්වා කාලය තුල වරිපනම් බදු විෂයයයේ රාජකාරි සඳහා විෂය නිලධාරියෙකු පත්කර නොතිබුණු අතර ආදායම් රැස්කරනු ලබන ආදායම් පරික්ෂකවරුන් විසින්ම, වරිපනම් බදු ලේඛනය පවත්වා තිබුණි.

3.2 ව්‍යාපෘති ප්‍රමාද කිරිම

------------------------

සභා ශක්තිමත් කිරිමේ ජාතික වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කිරිමට රු.60,000,000 ව්‍යාපෘති 21 ක් අනුමත කර තිබුණද ඉන් ක්‍රියාත්මක කර තිබුණේ එක් ව්‍යාපෘතියක් පමණක් වූ අතර රු.50,000,000 ක වටිනාකමක් සහිත ව්‍යාපෘති 20 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

සභාව විසින් විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොමැති අතර ප්‍රදේශයේ එක් රැස්වන කැලි කසල, රක්ෂිත වනාන්තරයේ ජල මූලාශ්‍ර ආශ්‍රිත ප්‍රදේශයකට අනාරක්ෂිතව බැහැර කරනු ලබන බව නිරික්ෂණය විය.

04 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

------------------------

උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍ර ලේඛයේ 6 ඡේදය ප්‍රකාරව සෘජුවම වගකියනු ලබන අභ්‍යන්තර විගණන නිලධාරියෙකු සභාවට පත්කර ගෙන නොතිබුණි.

4.2 විගණනය හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් කිසිදු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

----------------------------

නිශ්ක්‍රිය උගන උපයෝජිත වත්කම්.

----------------------------------------

(i) සභාව සතු පරිගණක උපකරණ, සහල් පිටි සැකසුම් මධ්‍යස්ථානයට අදාල උපකරණ කට්ටලය සහ අංක 53-5057 දරන කැබ් රථය වර්ෂ 2 -5 ත් අතර කාලයක සිට නිශ්කාර්යව පැවතුණු අතර ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි

(ii) රු. 4,937,955 ක් වටිනා දියබෙදුම දෙහිවත්ත කඩ කාමර 16 ක් සහිත ගොඩනැගිල්ල හා ඉඩම සහ රු. 909,900 ක් වටිනා බකමූණ පැරණි ජල ටැංකිය හා යාබද ඉඩම නිශ්කාර්යව පැවතුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) සණ අපද්‍රව කළමනාකරණය